# සී/ස ලංකා විදුලි (පුද්) සමාගම

# රැකියා අවස්ථා

සී/ස ලංකා විදුලි (පුද්) සමාගම, යනු ගනුදෙනුකරුවන් 500,000 කට අධික සංඛ්‍යාවකට සේවය සපයමින්, මීගමුව සිට ගාල්ල දක්වා වන වෙරළ තීරයේ මෙහෙයුම් ප්‍රදේශ ආවරණය කරමින් ශාඛා 07ක් සහ, 1500 ක් වන සේවක ශ්‍රම බළකායක් සහිත ශ්‍රී ලංකාවේ පිහිටි බෙදාහැරීම් ආයතනයකි. එම ආයතනය විසින් පහත තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ, විදුලි පද්ධති විශ්වාසනීය මට්ටම වැඩි දියුණු කිරීම සහ තෝරාගත් බෙදාහැරීම් ප්‍රදේශවල අනාගත විදුලි අවශ්‍යතාවය සපුරාලීම සඳහා ADB මගින් ආධාර සපයන, බලශක්ති විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි (PSRSP) තියැළීමට සුදුසුකම්ලත් පුද්ගලයින් බඳවාගනු ලැබේ.

**(01) ව්‍යාපෘති ගණකාධිකාරී**

| අධ්‍යාපන සුදුසුකම් | මූලික උපාධිය හෝ සමාන සුදුසුකම |
|---|---|
| **පළපුරුද්ද** | ● තනතුරට අදාලව අවම වශයෙන් වසර 04 ක විශේෂඥ පළපුරුද්ද හෝ<br>● රජයේ හෝ පුද්ගලික අංශයේ ව්‍යාපෘති ගිණුම්කරණය පිළිබඳ අවම වසර 06 ක අදාළ වෘත්තිමය පළපුරුද්ද සමග ව්‍යාපෘති මූල්‍යකරණය විගණනය, රක්ෂණ ආවරණ, ණය හැසිරවීම, සම්මත කොන්ත්‍රාත් කොන්දේසි සහ බිල්පත් ක්‍රමවේදය පිළිබඳ සෘජු පළපුරුද්ද සහ<br>● අවම වශයෙන් පහත එක් අංශයක වැඩ පළපුරුද්ද : බලශක්ති, ටෙලිකොම්, පරිසර යටිතල පහසුකම්, ජල හා අපජලය සහ ප්‍රවාහනය |
| **අනෙකුත් සුදුසුකම්** | ● ඉංග්‍රීසි භාෂාව විශිෂ්ට ලෙස කථා කිරීමේ සහ ලිවීමේ හැකියාව<br>● කාර්යක්ෂම පරිසරයක, නියමිත වේලාවන් වලදී වැඩ නිම කිරීමට කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව.<br>● ස්වාධීනව වැඩ කිරීමට, මූලිකත්වය ගැනීමට, ප්‍රමුඛතාවයන් හඳුනාගැනීමට, ව්‍යාපෘති සම්පූර්ණ කිරීම දක්වා දැක්ම සහිත විය යුතුයි. |

**පොදු කොන්දේසි :**

- තෝරාගනු ලබන අයදුම්කරු, වසර 02 ක මූලික කාලයක් සඳහා බඳවාගනු ලැබේ.
- තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව තරගකාරී සහ පුළුල් වේතන පැකේජයක් හිමි වේ.
- LECO ආයතනය, සියලුම දෙනා හට ගරුත්වයෙන් සලකන අතර, එහි පරිසරය තුළ සැමට සමාන අවස්ථාවන් ලබාදේ. එහෙයින් LECO විසින් අයදුම්කරුවන්ට තම ජාතිය, ජනවර්ගය, ආගමික සහ සංස්කෘතික වටපිටාව, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික හැඩගැස්ම හෝ ආබාධිත භාවය නොතකමින් මේ සඳහා අයදුම්කරන ලෙස ඉල්ලා සිටී.
- කරුණාකර ඔබේ සවිස්තරාත්මක ජීව දත්ත පිටපත, සහතිකපත්‍ර පිටපත් සමග ඥාතී නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන්, සහ දුරකථන අංක සමග 2022 අප්‍රේල් 20 වන දිනට හෝ ඊට පෙර පහත ලිපිනය වෙත එවන්න.

අයදුම්කරනු ලබන තනතුර ඔබගේ අයදුම්පත්‍රයේ සහ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර තිබිය යුතුයි.

**අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)**

**සී/ස ලංකා විදුලි (පුද්) සමාගම,**

**පළමු මහල, ඊ එච් කුරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.**